“ෆිත්රා යන කරුණු පහකි: ලිංග චර්ම ඡේදනය, ලිංගාශ්රිත රෝම කැපීම, උඩු රැවුල කැපීම, නියපොතු කැපීම, කිහිලි රෝම ඉවත් කිරීම.”

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් කරමින් සිටි ප්රකාශයකට
මම සවන් දී ඇත්තෙමි යැයි පවසා අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: “ෆිත්රා යන කරුණු පහකි: ලිංග චර්ම ඡේදනය, ලිංගාශ්රිත රෝම කැපීම,
උඩු රැවුල කැපීම, නියපොතු කැපීම, කිහිලි රෝම ඉවත් කිරීම.” [صحيح] [متفق عليه]

ඉස්ලාම් දහමින් වූ හා දූතවරුන්ගේ පිළිවෙත් අතරින් වූ කරුණු පහක් සම්බන්ධයෙන් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ පැහැදිලි කළහ: ඒවායින් පළමුවැන්න: චර්මඡේදනයයි. එනම් පුරුෂ ලිංගයේ මුණ්ඩයට ඉහළින් වැසී ඇති අමතර හම් කොටස කපා හැරීම හා කාන්තාවගේ යෝනි මාර්ගයට ඉහළින් වැසී ඇති හම් කොටස ඉවත් කිරීමය. දෙවැන්න: ලිංගාශ්රිත රෝම බෑම. එනම්, ලිංගය අවට වැවී ඇති රෝම බෑමය. ඒවායින් තුන්වැන්න: උඩු රැවුල කැපීම, එනම්: පිරිමියකුගේ උඩු තොලට ඉහළින් වැවී ඇති රැවුල, තොල පෙනෙන සේ කපා හැරීමය. සිව්වැන්න: නියපොතු කැපීම. පස්වැන්න: කිහිලි රෝම ඉවත් කිරීම.

http://sunnah.global/hadeeth/si/show/3144